දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

මගේ අංකය
எனது இல.
My No. PSC/APP/8/2/76/2021

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

2022 අගෝස්තු මස 31 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාළව.</u>

වර්තමානයේ පවතින අර්බුදකාරී ආර්ථික වාතාවරණය හේතුවෙන් රාජ්‍ය සේවය තවදුරටත් පුළුල් කිරීම වෙනුවට ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම කෙරෙහි රජයේ අවධානය යොමුව ඇති බැවින්, කාර්ය මණ්ඩල සමාලෝචනයක් මගින් ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් හඳුනාගන්නා තෙක්, අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් දී ඇති උපදෙස් අනුව රාජ්‍ය සේවයට නිලධාරීන් බඳවා ගැනීම් කටයුතු කල් දැමීම වඩාත් සුදුසු බවට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/GN/006/01/2021 දරන හා 2022.08.10 දිනැති ලිපියෙන් දන්වා ඇත.

02. ඉහත ලිපියට අවධානය යොමු කළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, කොමිෂන් සභාව පත්කිරීම් බලධරයා වන තනතුරු සඳහා බඳවා ගැනීමට අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී එම බඳවා ගැනීම සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල් ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පමණක් අදාළ අනුමැතියද සහිතව කෙටුම්පත් බඳවා ගැනීමේ නිවේදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ඔබට දැනුම් දීමට නියම කර ඇත.

03. ඒ අනුව අදාළ තනතුරු සඳහා බඳවා ගැනීම්වල දී ඉහත පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.